**ශීර්ෂය 252 - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
---------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මිය ගිය නිලධාරීන් හතර දෙනෙකුට අදාළව අය විය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 379,856ක් විය. 2022 වර්ෂයේ දී ඉහත හිඟ වටිනාකමෙන් රු. 221,206 ක් අයකරගෙන තිබුණි. 2018 වර්ෂයේ දී මියගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 65,900ක මුදල මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව 2018 වර්ෂයේ සිට විගණනය වෙත දන්වා තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල අයකර ගෙන නොතිබුණි. | නඩු කටයුත්තක් පැවතීම නිසා 2018 වර්ෂයේ දී මිය ගිය නිලධාරියාගෙන් එම ණය මුදල අයකර ගැනීම ප්‍රමාද වූ අතර, 2022 පෙබරවාරි 25 වන දින එම නිලධාරියාගේ භාර්යාව විසින් මරණ පාරිතෝෂිකය ලබා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර ඇති බැවින් එම පාරිතෝෂිකයෙන් ණය මුදල අයකර ගත හැකිය. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 01 හි (ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 1991 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ සේවය හැර ගිය නිලධාරීන් එකළොස් දෙනෙකුට අදාළව එකතුව රු.524,261 ක ණය ශේෂ හිඟ හිටව පැවැත එමින් තිබුණි. එම ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | රු. 95,140 ක ණය ශේෂය අයකරගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩු පැවරීම, රු. 168,664 ක ණය ශේෂ 04 ක් අයකරගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම, රු. 226,805 ක ණයකරුවන්ගේ ලිපින 04 ක් හඳුනාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත දැනුම් දීම, රු. 27,080 ක ණය ශේෂය, ඇපකරුගෙන් අයකරගැනීම සඳහා දන්වා යවා ඇති අතර ආරම්භයේ පැවති රු. 6,572 ක ණය ශේෂයෙන් මේ වන විට රු. 4,414 ක් අය වී තවදුරටත් රු. 2,159 ක මුදලක් අයවිය යුතුව ඇත. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 01 හි (ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(iii)** | 2020 හා 2021 වර්ෂවල දී විශ්‍රාම ගිය නිලධාරීන් හය දෙනෙකුගෙන් එකතුව රු.592,561 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට අයකර ගැනීමට අපොහොසත් වී තිබුණ අතර එයින් රු. 509,771 ක් 2022 වර්ෂයේ දී අයකරගෙන තිබුණි. | රු. 82,790 ක ණය ශේෂය සම්බන්ධයෙන් අදාල නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිකය සැකසීමට අදාල ලියකියවිලි එම දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. විශ්‍රාම පාරිතෝෂිකය ප්‍රදානය කළ පසු නිරවුල් කිරීම සිදු කළ හැක. විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සිදු කිරීම ප්‍රමාද වී ඇති බැවින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධයෙන් විමසා 2022.04.27 වන දින ලිපියක් යොමුකර ඇත. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 01 හි (ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.<br>.<br>. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 770(2) ප්‍රකාරව අපහරණය කිරීමට අවශ්‍ය නියෝග ලබා නොගෙන වටිනාකම රු.207,683 ක් වූ වත්කම් SA 82 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කර තිබුණි. | අදාළ අපහරණ (විනාශ කිරීම් - D) නියෝග අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය පරිදි 2021.11.29 වන දින විනාශ කරන ලද අතර, ඒ සඳහා මා විසින් අනුමැතිය ලබා දී ඇත. එබැවින් SA 82 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කිරීමක් ලෙස සටහන් කරන ලදී. 2021 වසරේ භාණ්ඩ සමීක්‍ෂණය මේ වන විට අවසන් කර ඇති අතර, එහිදී හඳුනාගෙන ඇති අපහරණ කළ යුතු භාණ්ඩද, මේ සමගම අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(ii)** | 2020 දෙසැම්බර් 31 දිනට සිදු කළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී විකුණා දැමීමට නිර්දේශ කර තිබුණු රු.1,907,417 ක වත්කම් මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් මූල්‍ය නොවන වත්කම්වලින් විකුණුම් ලෙස සඳහන් කර ඉවත් කර තිබුණි. නමුත් 2022 මාර්තු 25 දින වන විටත් එම වත්කම් විකුණා නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දින ට අදාළ භාණ්ඩ සමීක්ෂණයේ දී පොදු 47 ආකෘතියේ නිර්දේශ අනුව S (විකුණුම්) ලෙස සඳහන් අයිතමයන් විකුණුම් සඳහා දෙවතාවක් ආයතන 05 කින් මිල ගණන් කැඳවූ අතර මිල ගණන් එක් ආයතනයක් මඟින් පමණක් ලබා දී තිබුණි. එම මිල ගණන් හා නොගැලපීමත් අදාළ ආයතනයේ මිල ගණන් වලට එකඟ වීමෙන් රජයට මූල්‍යමය පාඩුවක් සිදු වන බැවින්, භාණ්ඩ විකුණුම් සිදු නොකරන ලදී. 2021.12.31 දිනට අවසන්ව ඇති භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය කර ගත් පොදු 47 ආකෘතියේ | 2021 නොවැම්බර් 26 දිනැති අංක 03/2021 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. . |

| | | | |
|---|---|---|---|
| | | සඳහන් (විකුණුම්) S ලෙස සඳහන් භාණ්ඩ සමඟ එම අයිතමයන් ද විකිණීම සඳහා කටයුතු කරනු ලබයි. | |
| **(iii)** | ආයතන දෙකක් විසින් දෙපාර්තමේන්තුව වෙත 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළදී ලබා දී තිබුණු එකතුව රු.5,457,819 ක් වටිනා ඩෙල් ලැප්ටොප් 12 ක්, ටැබ් පරිගණක 55 ක්, නෝට්බුක් පරිගණක 04 ක්, ලේසර් පින්ටර් 02 ක්, ඩොට්මෙට්‍රික් ප්‍රින්ටරයක්, ඩෙස්ක්ටොප් පරිගණක 04 ක් හා කලර් ප්‍රින්ටරයක් ලැබී තිබුණි. එම වත්කම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ලෙස ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම එම ආයතන දෙක විසින් එම කාල පරිච්ඡේදයේදී ලබා දී තිබුණු සැම්සුං ගැලැක්සි ටැබ් පරිගණක 70 ක්, තින්ක්පෑඩ් ලැප්ටොප් 10 ක් හා වයිපර් රවුටර් 10 ක වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ පරිත්‍යාග යටතේ ටැබ් පරිගණක 55 ක්, ලැප්ටොප් 12 ක්, නෝට්බුක් 04 ක් හා කලර් ප්‍රින්ටර්ස් 01 ක් සටහන් කිරීමට අවශ්‍ය තොරතුරු ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් සටහන් කිරීමට නොහැකි වූ අතර, 2022 වර්ෂය තුළ එම වත්කම් වලට අදාල තොරතුරු වාර්තා කිරීමට කටයුතු කරමින් පවතී . විදේශ ප්‍රදාන ලෙස නියැදි සමීක්ෂණ අංශයට ලැබී තිබූ සැම්සුම් ගැලැක්සි ටැබ් 70, තින්ක්පෑඩ් ලැප්ටොප් 10 සහ වයිෆයි රවුටර් 10 ප්‍රදානය කල රටින් එම භාණ්ඩවල වටිනාකම් විස්තර දෙපාර්තමේන්තුවට එවා නොමැති බැවින් ඒවායේ මිල ගණන් තක්සේරු කර ගැනීම සඳහා තක්සේරු කමිටුවක් පත් කර ඇත. එම කමිටුව මගින් හැකි ඉක්මනින් භාණ්ඩ තක්සේරු කර සිගාස් වෙත ඇතුළත් කරීමට ලබා දීමට නියමිතය. සිගාස් ගත කළ පසු මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කිරීමට ලබා දෙනු ඇත. | ලැබී තිබුණු පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වීම. |

**(ඇ) අග්‍රිම ශේෂය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.2 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරින් වෙනුවෙන් රැස්කර තිබුණු ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් නොකළ යුතු අතර, එය අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ගැලපිය යුතුව තිබුණි. එම උපදෙස්වලට පටහැනිව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් රැස්කල එකතුව රු.55,214,269 ක අදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රධාන ලෙජර් ලැබීම් යටතේ දක්වා තිබුණු අතර, අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. මේ නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.55,214,269 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙහි සඳහන් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් අයකරන ලද W&OP සහ ණය පොලී ආදායම් වෙනත් ආදායම් ගණන් නිලධාරීන් වෙනුවෙන් රැස් කරන ආදායම් සේ නොසලකා ඇත | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 7.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය සමඟ සැසඳූ විට 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂයට සමාන විය යුතුව තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය ඍණ (-) රු.23,937,125 ට අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙන් ලැබෙන ධන (+) රු.23,937,125 ට ගැලපූ පසුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 0 ක් වේ. නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.1,486,732 ක් ලෙස දක්වා තිබුණි. | වර්ෂය අවසානයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය අග්‍රිම ශේෂය ලෙස දක්වා ඇත. 2022 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ගැලපීම් කිරීමට කටයුතු කර ඇත. | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(iii)** | 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය ඍණ (-) රු.23,937,125 ක් වී තිබුණි. සංශෝධිත ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය ඍණ (-) රු. 23,937,125 ක් වී තිබුණි. එම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ශේෂය සමඟ ගැලපූ විට ඍණ (-) රු.47,874,250 ක් වේ. | අතපසුවීමකින් නිවැරදි ආකෘතිය භාවිතා කර නොමැති වීම. | 2021 දෙසැම්බර් 30 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| නමුත් අග්‍රිම ගැලපුම් ශේෂය ධන (+) රු.23,937,125 ක් විය යුතුව තිබුණත් එය සංශෝධිත ACA 7 ආකෘතිය නිවැරදි ලෙස ඉදිරිපත් නොකර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති සටහන් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය ශුන්‍ය අගයක් ලෙස තාර්කික ලෙස ඉදිරිපත් වි නොතිබුණි. | | |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 වියදම් කළමනාකරණය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් පහක් සඳහා රු.93,090,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් කිසිදු උපයෝජනයක් නොකර ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා රට වසා තැබීම හා රාජකාරි සීමා කිරීම හේතුවෙන් සහ 2021.08.31 දිනැති කැබිනට් තීරණ දැනුම් දීමට අනුව ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම නතර කිරීම, වෛරස් ගාඩ් සමග නව පරිගණක මිලදී ගැනීම හේතුවෙන් වෛරස් ගාඩ් මිලට ගැනීමට මුදල් අවශ්‍ය නොවීම, නිලධාරී දීමනා ගෙවීම සඳහා වැටුප් හා සේවක නීර්ණන කොමිෂන් සභාවේ අනුමැතිය නොලැබීම මත ප්‍රතිපාදන ඉතිරි වීම් ඇති වී තිබුණි. | මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 23 ක එකතුව රු. 2,120,027,667 ක අධිප්‍රතිපාදන සලසා ගැනිම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු. 317,475,349 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු. 1,802,552,318 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණු අතර, එය එක් එක් වැය විෂය වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මෙම ඉතිරි කිරීම් වලට අදාල පැහැදිලි කිරීම් ඒසීඒ 2(11) ආකෘතිය යටතේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය තුල ඇතුලත් කර ඇත. | මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 7.2 ඡේදය. | දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් හා මුදල්වලට සමාන දෑ හි ශේෂයට ඇතුළත් නොකළ යුතුව තිබුණි. නමුත් මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශයේ දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරයට ප්රේෂණය කර තිබුණු රු.1,486,732 ක මුදල් ශේෂය, මුදල් හා මුදල්වලට සමාන දේ ලෙස දක්වා තිබුණි. | වර්ෂය අවසානයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබද ප්‍රකාශයට අතපසුවීමකින් ඇතුළත් වී ඇත. ඊට අදාළ ගැලපීම් 2022 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී කරනු ලැබේ. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත් දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු.71,269,682 ව් තිබුණි. එම චෙක්පත් තුළ නිකුත් කර බැංකුව වෙත ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ එකතුව රු.263,542 ක චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල්ඉකුත් වූ චෙක්පත් සඳහා මේ වන විට සිහි කැඳවීම් ලිපි නිකුත් කර ඇති අතර දින දීර්ස කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ ආයතන සඳහා චෙක්පත් දින දීර්ස කිරීම් සිදු කර ඇති අතර එසේ ඉදිරිපත් නොකල චෙක්පත් අවලංගු කර එම වටිනාකම රජයේ අදායමට බැර කිරීමට මේ වනවිට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාලීනවූත් නිවැරදිවූත් දත්ත ලබාදීම මඟින් වඩාත් ඵලදායි ලෙස දේශයේ සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වශයෙන් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දත්ත වාර්තා 62 | රට තුල පැවති කෝවිඩ් 19 වසංගත රෝග තත්ත්වය නිසා මුළු දිවයිනට ම බලපාන පරිදි ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම නිසා කාර්යාල වසා තිබීමත්, නිලධාරීන් සේවා මුර ක්‍රමයට සේවයට කැඳවීමත්, යන අපගේ පාලනයෙන් තොර හේතු නිසා වාර්තාවන් නියමිත | නියමිත දින වකවානු තුළ දත්ත නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ක් වෙබ් අඩවියට නිකුත් කල යුතුව තිබුණු අතර, දත්ත වාර්තා 23 ක් මුද්‍රණය කර නිකුත් කල යුතුව තිබුණි. එම වාර්තා දින දර්ශනයේ සඳහන් කාලවකවානු තුළ නිකුත් කළ යුතුව තිබුණත්, එම වාර්තාවලින් කිසිදු වාර්තාවක් නියමිත දිනවලදී නිකුත් කර නොතිබුණු බව නිරික්ෂණය විය. වාර්තා නිකුත් කිරීමේ දී මාස 01 ක සිට මාස 11 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයන් සිදු වි තිබුණි. | දිනයන්ට නිකුත් කිරීමට නොහැකි විය. තවද 2021 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන සියලුම ප්‍රකාශන සකස් කිරීම සඳහා නව මාර්ගෝපදේශ සංග්‍රහයක් නිකුත් කරන ලද අතර එම මාර්ගෝපදේශයන්ට අනුකූල වන සේ සියලු ප්‍රකාශන වල පිටු සැකසුම සිදු කිරීමට නියමිත විය. මේ සඳහා අමතර කාලයක් වැය වීමට සිදුවීමෙන්ද සුළු ප්‍රමාදයක් සිදු වී තිබුණි. | |
| (ආ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තා අනුව අංශ 06 කට අදාලව ඉලක්ක ගත කාර්යයන් 11 ක කිසිදු කාර්යසාධනයක් ඉටු කර නොතිබුණි. | කොවිඩ් - 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් ජන සංගණන හා ප්‍රජාවිද්‍යා අංශයට නියමිත පරිදි ටැබ්ලට් පරිගණක යන්ත්‍ර නොලැබීම හේතුවෙන් අදාළ පරිදි නියමිත කාල පරිගණක ආශ්‍රිත පුද්ගලික සම්මුඛ පරීක්ෂණය (CAPI) පූර්ව පරීක්ෂා පුහුණුව, පූර්ව පරීක්ෂාවේ ක්ෂේත්‍ර කටයුතු, CAPI වැඩසටහනෙහි සහ ක්‍රමවේදයේ වෙනස්කම් සිදු කිරීමට අවශ්‍ය හඳුනාගැනීම,<br>ජන සංගණන හා ප්‍රජාවිද්‍යා අංශයේ, "ලැයිස්තුගත කිරීමේ අදියර - ජන හා නිවාස සංගණනය 2021" හි පුහුණුකරුවන් පුහුණු කිරීමේ කටයුතු සිදු කළ නොහැකි විය.<br><br>ජාතික ගිණුම් අංශයේ, සැළසුම් කල පරිදි මාධ්‍ය සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීමට නොහැකි වීම. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා නිවැරදිව සැලසුම් කර ඒවා නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ජන හා නිවාස සංගණනයේ ලැයිස්තුගත කිරීමේ අදියර ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ වී නොමැති බැවින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ, “ඉ - සංගණනය සඳහා ලියාපදිංචි වීම” සඳහා ජන හා නිවාස සංගණනයේ ලැයිස්තුගත කිරීමේ අදියර ක්‍රියාත්මක කිරීමේ කාර්යය සිදුකිරීමට නොහැකි වීම. “ජන හා නිවාස සංගණනය 2021: පශ්චාත් ගණන් කිරීමේ සමීක්ෂණය” ජන හා නිවාස සංගණනයෙන් පසුව සිදුවන සමීක්ෂණයකි. රට තුල පැවති කොවිඩ් -19 වසංගත රෝග තත්ත්වය මත ජන හා නිවාස සංගණනයේ ලැයිස්තුගත කිරීමේ අදියර ක්‍රියාත්මක කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ වී නොමැති බැවින් මෙම කාර්යය සිදුකිරීමට අවස්ථාවක් නොවීම. | |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ අංශ 12 ක ඉලක්ක ගත කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය සියයට 10 ක සිට සියයට 85 ක් දක්වා පරාසයක පැවැතුණි. | කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශයේ, වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2020, වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය - 2019, වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය- 2020 හා වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2020 යන සමීක්ෂණ, රට තුළ පැවති | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු වීම. |

කොවිඩ් - 19 වසංගත රෝග තත්ත්වය සහ වෙනත් හේතු මත එම වාර්තා හතර පිළිවෙලින් 2022/07/29, 2022/07/29, 2022/12/30 හා 2022/07/29 දින ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. "මාසික කර්මාන්ත නිෂ්පාදන දර්ශකය ගණනය කිරීමට අදාල පදනම් වර්ෂය වෙනස් කිරීම" යන කාර්යය සඳහා දත්ත එක්රැස්කරමින් පවතින බවත් ජාතික ගිණුම් අංශයේ, වැඩසටහන් පැවැත්වීමේ කාර්යසාධනය සියයට 40 ක මට්ටමක පැවතීම.

නියැදි සමීක්ෂණ අංශයේ, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2019 සිදුකිරීමට අදාල දර්ද්‍රතා රේඛාවේ පදනම් වර්ෂය වෙනස් කිරීමට අමාත්‍යාංශය සමඟ අවසන් තීරණයකට එලඹීමට නොහැකි වීම නිසා සමීක්ෂණයේ අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට නොහැකි විය.

වැඩිහිටියන්ගේ දුන්කොල භාවිතය පිළිබඳ ගෝලීය සමීක්ෂණය (GATS) - 2019/20 සඳහා වාර්තා සැකසීමේ කටයුතු, අන්තර් ජාතික ශ්‍රම සංඛ්‍යාලේඛනඥවරුන්ගේ 19 වන සම්මේලනයේදී (ICLS) ගත් තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියමු අධ්‍යයනය, පානීය ජලයේ ගුණාත්මක තත්වය පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය හා සයිබර් ආරක්ෂණය පිළිබඳ සමීක්ෂණයේ නියමු අධ්‍යයනය හා ජාත්‍යන්තර සංක්‍රමණික

සේවකයින් බඳවා ගැනීමේ පිරිවැය පිළිබඳ සමීක්ෂණය යන කාර්යයන් වල අපේක්ෂිත භෞතික ප්‍රගතිය අත්කරගැනීමට නොහැකි විය.

දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් 10 ක් සැලසුම් කරන ලද අතර බාහිර ආයතන සඳහා වැඩසටහන් 05 ක් සඳහා නිලධාරීන් යොමු කරන ලද අතර දෙපාර්තමේන්තු පුහුණු අංශය තුළ පැවැත්වීමට සැලසුම් කළ වැඩසටහන් අතුරින් පැවැත්වීමට හැකි වූයේ එක් වැඩසටහනක් පමණක් වීම.

පශ්චාත් සංගණන සමීක්ෂණයට අදාළ සංගණන ඒකක ලැයිස්තුගත කිරීම අවසන් කිරීමේ ප්‍රගතිය සියයට 15 ක් වීම සහ පර්යේෂණ සම්මන්ත්‍රණ 4ක් පැවැත්වීමට නොහැකි විය. ස්ත්‍රී /පුරුෂ භාවයට අදාළ දර්ශකාංක ඇතුළත් ප්‍රකාශනය නිකුත් කිරීම යන කාර්යය සිදු කර අවසන් කළ නොහැකි විය.

දත්ත නිකුත් කිරීමේ ඒකකයේ අපේක්ෂිත නිමැවුම් මට්ටම ළඟාකරගැනීමේ ප්‍රතිශතය සියයට 76 ක් ලෙස සඳහන් කර තිබුණි.

ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ නිමැවුම් මට්ටම ළඟාකරගැනීමේ ප්‍රතිශතය සියයට 85 ක් ලෙස දක්වා තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 දෙසැම්බර් 29 දින පෞද්ගලික සමාගමකින් රු. 16,320,304 කට 10 KVA යන්ත්‍ර 06, 20 KVA යන්ත්‍ර 6, 30 KVA යන්ත්‍ර 05 ක් හා 40 KVA යන්ත්‍රයක් වශයෙන් යන්ත්‍ර 18ක් මිලදී ගෙන තිබුණි. එම යන්ත්‍ර භෞතිකව පරීක්ෂා කිරීමේ දී 2014 දෙසැම්බර් 29 දින මිලදී ගත් දින සිටම 15 KVA යන්ත්‍රයක් 07 වන මහලේ බටහිර කොටසේ නිෂ්ක්‍රීයව පැවැතුණි. | ගොඩනැගිල්ලේ 07 වන හා 08 වන මහල් ගොඩනැගිලි කමිටුව මගින් මුදල් අමාත්‍යාංශය සඳහා වෙන් කර තිබුණ නිසා එම අමාත්‍යාංශයේ අවශ්‍යතාවය අනුව විදුලි පේනු සවි කිරීමට සිදු වන බැවින් එම මහල් වලට විදුලි පෙනු සවි කිරීමක් සිදු කර නොමැත. මුදල් අමාත්‍යාංශයේ විෂයය පථය වරින් වර වෙනස් වීම හේතුවෙන් අමාත්‍යාංශය අප ගොඩනැගිල්ලට පැමිණීමේ අවශ්‍යතාවක් ඇති නොවීය. මේ හේතුව නිසා 07 වන මහලේ දකුණු පස කොටසේ ඇති UPS යන්ත්‍රය භාවිතයට ගැනීමක් සිදු නොවීය. මේ වන විටත් එම යන්ත්‍රය භාවිතයට ගත හැකි තත්ත්වයක පවතින බව කාරුණිකව දන්වමි.<br><br>සංගණන සිදු කරන අවස්ථාවේදී අදාල සංගණනය සිදු කරනු ලබන අංශයේ සහ ඊට අදාල අතිරේක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සඳහා ICT අංශයේ භාවිතය සඳහා 07 වන මහලේ දකුණු පස කොටස මේ වන විට වෙන් කර ඇති බැවින් UPS යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අදාල විදුලි පේනු සවි කිරීම සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙතින් මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන අනුමැතිය සඳහා මේ වන විට ඉදිරිපත් කර ඇත. | මිලදී ගන්නා ලද වත්කම් උපරිම ධාරිතාවයෙන් යුතුව භාවිතා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ 03 ප්‍රකාරව කටයුතු කර 2018 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණු වාහන 04 ක අපහරණ කටයුතු සිදු කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. | වාහන 04 ධාවනයෙන් ඉවත් කර ඇත. මෙම වාහන අපහරණය කිරීම උදෙසා 2019.09.25 දිනැති ලිපියෙන් කමිටුවක් පත් කර ඇත. මෙම වාහන අමාත්‍යාංශ කිහිපයක් මගින් වාහන හිගතාවය සලකා බලා ලබාදෙන ලෙස ඉල්ලීම් කර වාහන පරීක්ෂා කිරීමට නිලධාරීන්ද පැමිණෙන ලදි . නමුත් එම අමාත්‍යාංශ වාහන ලබා ගැනීමට එකඟ නොවූ අතර වාහන සම්බන්ධයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත 2021.05.05 වාර්තා කරන ලදි. යතුරු පැදිය දෙපාර්තමේන්තුවේ තැපැල් රාජකාරී සඳහා අළුත්වැඩියා කිරීමටත් අනෙක් වාහත අපහරණය කිරීමටත් විධිමත් පරිදි කටයුතු කරමි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ 03 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අපහරණ කටයුතු සිදු කළ යුතු වීම. |
| (ඇ) | මූ.රෙ. 1647 (ආ) පරිදි වාහන ද ඒවායේ උපකරණ ද පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව 2020 වර්ෂයේ දී එසේ සමීක්ෂණ සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව වාහන වල ඇති උපකරණ සමික්ෂණයක් සිදු කිරීමට තීරණය කර ඇති අතර එම සමීක්ෂණයෙන් පසුව අදාල වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | අනුයුක්ත කළ නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ගේ රාජකාරීමය ගමන් සඳහා රියදුරුට අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීමට අදාළ විස්තර 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය පරිදි ඇමුණුම 1 හි ආකාරයට සටහන් කළ යුතු වුවත්, | මේ වන විට අදාල ආකෘතිය සම්පූර්ණ කර අංක 13/2008 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර ඇති බව. | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ නිල රථ 8ක් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි | | |
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරනරාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව දක්වා ඇති ආකෘතිය පරිදි වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදුකළ දින සිට පාවිච්චි කළ ඉන්ධන ප්‍රමාණය සහ පසු ගිය මාසයේ දී පාවිච්චි වූ ඉන්ධන ප්‍රමාණය දැන ගැනීමට හැකිවන පරිදි වාහන පිළිබඳ සටහන් පවත්වා ගත යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳ ඒ අනුව සටහන් පවත්වා ගෙන නොතිබුණි. | පසුගිය කාලයේ රටේ පැවති වසංගත තත්තවය, බොහෝ අවස්ථා වල නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරිම හා රජයේ වියදම් පාලනය කිරිම යන කරුණු නිසා ඉන්ධන දහන පරික්ෂාවක් සිදු කිරිමට නොහැකි විය. දැනට ඉන්ධන ලබා ගැනිමට ඇති අපහසුතාවය සමනය වූ වහාම ප්‍රධාන කාර්යාලයේ වාහන සඳහා ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරිමටත්, දිස්ත්‍රික් කාර්යාල වල වාහන සඳහා අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉන්ධන දහන පරික්ෂාවක් සිදු කිරිමට කටයුතු සම්පාදන කර ඇත. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | මුදල් රෙගුලාසි 1647(ඇ) පරිදි එක් ස්ථානයක වාහන තුනක් හෝ ඊට වැඩි ගණනක් ඇති විටදී කල් නොපවත්නා වුව ද , ලොග් පොතෙහි සටහන් නොකරනු ලබන්නා වූ ද, සියලුම ද්‍රව්‍ය මිල දී ගැනීම් හා නිකුත් කිරීම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුව ද, එවැනි ලේඛනයක් ප්‍රවාහන අංශයේ පවත්වා නොතිබුණි. | පරිභෝගික භාණ්ඩ ලේඛණයක් 2022 වර්ෂයේ සිට පවත්වා ගෙන යනු ලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (උ) | 2016 දෙසැම්බර් 29 දින අංක 30/2016 රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ | පසුගිය කාලයේ රටේ පැවති වසංගත තත්තවය, බොහෝ අවස්ථා වල නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරිම හා රජයේ වියදම් පාලනය කිරිම යන | 2016 දෙසැම්බර් 29 දින අංක 30/2016 රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු |

| | | |
|---|---|---|
| 3.1 ඡේදය ප්‍රකාරව වාහන 24 ක ලොග් සටහන් අනුව කිසි දිනක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. වාහන 08 ක 2003 වර්ෂයේදීද, තවත් වාහනයක් 2004 වර්ෂයේදී ද සිදු කර තිබුණි. | කරුණු නිසා ඉන්ධන දහන පරික්ෂාවක් සිදු කිරිමට නොහැකි විය. දැනට ඉන්ධන ලබා ගැනිමට ඇති අපහසුතාවය සමනය වූ වහාම ප්‍රධාන කාර්යාලයේ වාහන සඳහා ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරිමටත්, දිස්ත්‍රික් කාර්යාල වල වාහන සඳහා අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉන්ධන දහන පරික්ෂාවක් සිදු කිරිමට කටයුතු සම්පාදන කර ඇත. | වීම. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව චෙක්පත් අත්සන් කිරීමට බලය පවරන ලද නිලධාරීන් 06 දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබා නොතිබුණි. | ප්‍රධාන මූල්‍ය නිලධාරි රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හරහා නියමිත පරිදි ඇප තබා ඇත. ප්‍රධාන ගණකාධිකාරි විදුලි බල අමාත්‍යාංශය මගින් ඇපකාර සංගමය වෙත ඇප තැබීම උදෙසා ඉල්ලුම් පත යොමු කර ඇත. අතිරේක අධ්‍යක්ෂ (පාලන) ජාතික ඉතිරි කිරීමේ බැංකුව (තංගල්ල ශාඛාව) වෙත ඇප තැන්පත් කර පාස් පොත ඉදිරිපත් කර ඇත. අනෙකුත් නිලධාරීන් සඳහා ඇප තැන්පත් කිරීමට කටයුතු කරගෙන යන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 428 ක් හෙවත් සියයට 25ක් පුරප්පාඩුව පැවැතුණි. එම පුරප්පාඩුවලින් තනතුරු 151ක් හෙවත් සියයට 35ක් ද්විතියික මට්ටමේ නිලධාරීන්ගේ තනතුරු වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු කරගෙන යාම සඳහා පුරප්පාඩු පවතින තනතුරු පිරවීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් පුරප්පාඩු පිරවීමට අදාල කටයුතු කරමින් පවතින බව. | මෙම තනතුරු පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම තනතුරු කඩිනමින් පිරවීමට කටයුතු කළයුතු වීම. |